**SAMODHANA**

**Vol. 9, Issue II, (December) 2020**

*The Journal of Faculty of Social Sciences and Humanities*

Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# සංස්කෘතික විපර්යාසය හමුවේ නූතන සිංහල කවියේ ගමන්මඟ පිළිබඳ විමර්ශනයක්

## (එක්දහස් නවසිය අසූව දශකය ඇසුරින්)

පූජ්‍ය ගල්කුලමේ උපරතන හිමි සහ කේ.එම්.පී. මනීෂා චමෝදනී

භාෂා අධ්‍යයනාංශය

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මිහින්තලේ

*correspondence: upa071@gmail.com

Received: 15 October 2020

Accepted: 15 December 2020

**Abstract**

In 1970s we recognize the drastic changes in Sri Lankan society in relation to the open economic policy. It's a turning point of cultural differences activities as well. It's not a secret that vast social changes happened in this chapter. There was a direct effect of for social and cultural trend even in the Sinhala literature this condition thoroughly affected. During the era of 1980's was very significant and this mode of cultural differences more and more developed for the 1990's poets was most vulnerable and comprehensive. Ethnic conflict, youngsters joblessness, mental disorders and unrest as well as self – sufficiently economical systems down fall and identification normality became factors for this problem. During this period of time who were in the same category tried their level best to show their talents became best heroes poetic calibre. As we know they were Ratnasri Wijesingha, Nandana Weerasingha, Eric Eliyapparachchi, Ariyawansa Ranaweera. This article shows the significant effects of the above ??? or parts The 1980's were seriously complex because of cultural changes in the various categories and how they innovative also social arguments were installed in these Sinhala modern poetry.

Keywords: cultural trend, modern poetry, social changes, 80th decade

## 1. හැඳින්වීම

සිංහල කවිය සිය නූතන මුහුණුවර වෙත ළඟා වීම සඳහා දිගු ඉතිහාසයක් පසු කර ඇත. මහා කාව්‍ය සම්ප්‍රදාය මෙන් ම චූල කාව්‍ය සම්ප්‍රදායයන් ද එහි ලා දායකත්වය සපයා ඇති බව පැහැදිලි වේ. මෑත කාලීන ව ගොඩ නැඟුණු කොළඹ යුගයේ වැඩිහිටි කාව්‍ය ව්‍යාපාරය, කොළඹ යුගයේ තරුණ කාව්‍ය ව්‍යාපාරය මෙන් ම නිදහස්-නිසඳැස් යුගය ද මෙහි ලා සිදු කර ඇති බලපෑම සුළු කොට තැකිය නො හැකි ය. එහෙත් ඒ අතර එක් දහස් නවසිය අසූව දශකයට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කම කි.

සිංහල කාව්‍ය ව්‍යාපාරය පෝෂණය කිරීම සඳහා ස්වකීය නිර්මාණාත්මක දායකත්වය සපයමින් සිටින ප්‍රබල කාව්‍ය පරපුරක් අසූව දශකයේ දී හමුවේ. රත්න ශ්‍රී විජේසිංහ, නන්දන වීරසිංහ, එරික් ඉලයප්පආරච්චි, ආරියවංශ රණවීර යන කවීන් වඩා ත් සාර්ථක ලෙස ඉදිරියට පැමිණෙනුයේ මෙම දශකයේ ය. මෙම දශකයේ කාව්‍ය ව්‍යාපාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී යථෝක්ත කවීන් මේ යුගයේ දී ප්‍රකාශයට පත් කළ කෘති කිහිපයක් පිළිබඳ අවධානය යොමු කිරීම මෙහි දී සිදුකර ඇත.

| | | |
|---|---|---|
| රත්න ශ්‍රී විජේසිංහ | - | වස්සානේ (1985), සුබ උදෑසන (1988) |
| නන්දන වීරසිංහ | - | ගිංගඟේ විලාපය (1984) |
| එරික් ඉලයප්පආරච්චි | - | ආලින්දය (1988), සිදුහත්ගේ අගමෙහෙසිය (1981) |
| ආරියවංශ රණවීර | - | ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ (1988)<br>කවි කිහිපයක් (1984) |

මෙම කාව්‍ය ග්‍රන්ථ පිළිබඳ ව අවධානය යොමු කිරීමෙන් ම මෙම දශකයේ කවිය අධ්‍යයනය කිරීම කෙතරම් වැදගත් ද යන්න අවබෝධ කර ගත හැකි වේ. ඉහත සඳහන් කවීන්ට අමතර ව තවත් විශාල කවි කිවිඳියන් පිරිසකගේ දායකත්වය මෙම දශකයේ කාව්‍ය ක්ෂේත්‍රයේ විද්‍යමාන වේ. ප්‍රමාණවත් වශයෙන් මතු නො ව ගුණාත්මක වශයෙන් ද මෙම යුගයේ දී සිංහල කවියට හිමි වූ දායකත්වය අසාමාන්‍ය වටිනාකමකින් යුක්ත ය. නූතන සිංහල කවියේ අන්තර්ගතය (content) මෙන් ම ස්වරූපය (form) තීරණය කිරීම විෂයෙහි අතිශය තීරණාත්මක බලපෑමක් මෙම දශකයේ දී සිදු වූ බව පැවසිය හැකි ය.

මෙ තරම් වැදගත්කමක් සහිත කාල පරිච්ඡේදයක් වුව ද සිංහල ශාස්ත්‍රඥයන් අතින් මේ යුගයේ කවිය පිළිබඳ විෂය මූලික වූ ත්, ඓතිහාසික වූ ත්, රැඩි වූ ත් අධ්‍යයනයක් සිදු වී නැත. අගුළුගහ ධම්මිනන්ද හිමියන් විසින් රචනා කරන ලද සිංහල කාව්‍යයේ නව ප්‍රවණතා (1991), මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් රචනා කරන ලද නූතන සිංහල කාව්‍ය විමර්ශන ලේඛන ද්විතීය භාගය (2002) සහ සරත් විජේසූරිය විසින් රචනා කරන ලද නිර්මාණකරණය හා දේශපාලනය (2007) බඳු කෘතීන්හි මෙම දශකයේ කාව්‍ය රචනා පිළිබඳ යම් ආකාරයකට සඳහන් වුව ද ඒවායෙහි අපේක්ෂාව වී ඇත්තේ මෙම දශකයේ කාව්‍ය නිර්මාණ පිළිබඳ ව පමණක් අවධානය යොමු කිරීම නො වන බව පෙනී යයි.

මීට අමතර ව විවිධ කාව්‍ය විචාර සංග්‍රහවල මේ යුගයේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විචාර පළ වී ඇත. මහාචාර්ය සුචරිත ගම්ලත්, පියසීලි විජේගුනසිංහ හා ලියනගේ අමරකීර්ති බඳු විචාරකයින්ගේ ලේඛන මේ අතර ප්‍රමුඛ වේ. එහෙත් මෙ කී විචාර මඟින් බහුල වශයෙන් සිදු වී ඇත්තේ කාව්‍යයේ කිසියම් එක් අංශයක් හෝ අංශ කිහිපයක් පමණක් ඉස්මතු කර දැක්වීම ය. විචාරකයා විසින් අවධානය යොමු කර ඇති ක්ෂේත්‍රය විනා එ මඟින් අසූව දශකයේ බිහි වූ කවිය පිළිබඳ පොදු චිත්‍රයක් මවා ගැනීම අපහසු ය. එබැවින් මෙම ලිපිය මඟින් තත් දශකයේ සංස්කෘතික විපර්යාසය හමුවේ සිංහල කවියේ ගමන් මාර්ගය වෙනස් වූ අයුරු විමසා බැලීම සිදු වේ.

## 2. පර්යේෂණ ගැටලුව

සංස්කෘතික විපර්යාසය/වෙනස් වීම තුළ සිංහල කවියට ලැබී ඇත්තේ ප්‍රධාන ස්ථානය කි. මන්ද යත් කවියා සමාජීය සත්වයෙකි. සිය කාව්‍ය නිර්මාණ සඳහා හෙතෙම වස්තු විෂයන් ඒකරාශී කර ගනු ලබන්නේ ස්වකීය සමාජ ජීවිතය තුළිනි. එබැවින් ඔහුට තම අවට සිදු වන දෑ දෙස වඩාත් විමසිල්ලෙන් බැලීමට සිදු වේ. සංස්කෘතික චලිතයන් පිළිබඳ වඩා සංවේදී වීමට සාමාන්‍ය ජනයාට වඩා කවියාට හැකියාව පවතින්නේ එහෙයිනි. මුල් කාලීන නිර්මාණකරුවන් සමාජීය සංස්කෘතික ප්‍රවාහය එතරම් දුරට සිය නිර්මාණ සඳහා පාදක කර ගැනීමක් දක්නට නො ලැබේ. ඔවුහු වැඩි වශයෙන් කවියේ නිර්මාණාත්මක ලක්ෂණ ආරක්ෂා කිරීමට ප්‍රයත්න දැරූහ.

එහෙත් එක් දහස් නවසිය අසූව දශකයේ කවීන්ට ඊට වඩා සමාජමය වගකීමක් ඉටු කිරීමට සිදු ව තිබූ බව ඔවුන්ගේ නිර්මාණ නිරීක්ෂණයෙන් පෙනී යයි. ඒ අනුව තත් යුගයේ නිර්මාණකරුවන් ස්වකීය කාව්‍ය නිර්මාණවල සෞන්දර්යාත්මක ලක්ෂණ පරයා යුගයේ මතු වී පැවති සමාජ සංස්කෘතික සත්තාවන් පිළිබඳ අවධානය යොමු කර ඒ පිළිබඳ කතිකාවතක නිරත වූයේ ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ ගැටලුව වී ඇත.

## 3. පර්යේෂණ අරමුණ

අද්‍යතන සිංහල කාව්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා උපකාරී වනු ඇතැයි අපේක්ෂා කරන කාලෝචිත සංකල්පයක් වශයෙන් 'සංස්කෘතික විපර්යාසය යන තේමාව කෙරෙහි නිර්මාණකරුවන්ගේ මෙන් ම සහෘදයන්ගේ තීක්ෂණ අවධානය යොමු කරලීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ.

## 4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා පාදක කරගෙන ඇත්තේ 80 දශකයේ ජනප්‍රියත්වයට පත්ව ඇති කවීන් කිහිප දෙනෙකුගේ නිර්මාණ ය. එම නිර්මාණ තුළ අන්තර්ගත කරුණු විචාරාක්ෂියෙන් බලා තත් යුගයේ සංස්කෘතික විපර්යාසය කෙතෙක් දුරට තම නිර්මාණ සඳහා පාදක කරගෙන ඇත්දැයි විමසා බැලීමය. මෙම පර්යේෂණය හුදෙක් ගුණාත්මක පර්යේෂණ ගණයට අයත් වන අතර, පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් පුස්තකාල ගවේෂණය ප්‍රධාන වශයෙන් භාවිත කොට ඇත. මීට අමතරව, තත් යුගයේ සංස්කෘතික විපර්යාසය අධ්‍යයනය කිරීම සඳහා සමකාලීන විද්වතුන්ගේ අදහස් ද පාදක කරගැනීමට අවස්ථාව උදා කරගෙන ඇත.

## 5. සාකච්ඡාව

**'සංස්කෘතිය'** යන්න සිංහලයට හින්න වී ඇත්තේ ඉංග්‍රීසි භාෂාවේ **'culture'** යන පදය ඇසුරු කර ගෙන ය. මානව විද්‍යාත්මක අර්ථයෙන් විමසීමේ දී සංස්කෘතිය පිළිබඳ සංකල්පය සවිස්තරාත්මක ව විග්‍රහ වෙයි. මානව පැවැත්මේ සෑම ක්‍රියාකාරකමක් ම සංස්කෘතියට සම්බන්ධ වේ. මෙහි දී ජීවන රටාව මෙහෙයවන ආර්ථික චර්යාව, සමාජ චර්යාව, දේශපාලන හා ආගමික චර්යාව, විනෝද කටයුතු ආදි මේ සියල්ල ම සංස්කෘතියේ අංග වශයෙන් හැඳින්වේ.

සංස්කෘතිය යනු "යම් කෙනෙකු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ලබා ගන්නා දැනුම, විශ්වාස, කලාව, සාරධර්ම, නීතිය, සිරිත් හා වෙනත් හැදියාවන් සහ පුරුදු ආදි දෙයෙහි එකතුව යි (Tylor,1926:1)" යනුවෙන් **'Primitive Culture'** නම් කෘතියේ සඳහන් වේ. ඔහුට අනුව මිනිසා විසින් රැස් කර ගන්නා ලද දැනුමේ පටන් චින්තනය දක්වා සංස්කෘතිය මත පදනම් වන බව පැහැදිලි ය. එමෙන් ම සංස්කෘතිය ගෙවෙන සෑම තත්පරයකම පාසා විපර්යාසයට/ වෙනස්වීමට ලක් වෙමින් පවතින අතර එය පිළිගැනීමට මිනිසුන් නො ඉවසිලිමත් වීම ද විශේෂත්වය කි.

වර්තමානය වන විට සාම්ප්‍රදායික සංස්කෘතිය සම්පූර්ණයෙන් පාහේ නවීකරණය වී ඇති සෙයක් දක්නට ලැබේ. ජනප්‍රිය සංස්කෘතියේ බලපෑම මත ඉතා වේගයෙන් වෙනස් වන දේශීය සංස්කෘතිය යම් ආකාරයක වෙනස් වීමකට හසු වී ඇති සෙයක් දක්නට ලැබේ. එහි සාධනීය සහ නිශේධනීය තත්වයන් නොයෙක් ආකාරයට විද්‍යමාන වුව ද චිරාත් කාලයක් මුළුල්ලේ මෙ රට පැවත ගෙන ආ සම්ප්‍රදායික සංස්කෘතියට දැඩි ලෙස පහර වැදීමක් ජනප්‍රිය සංස්කෘතියෙන් සිදු වූ බව කිව මනා ය. මෙම තත්වය සාහිත්‍යය විෂයෙහි බල නොපා තිබීමට කිසිදු හේතුවක් හෝ අවකාශයක් ද නොමැත.

සාහිත්‍යය නිර්මාණයක මුඛ්‍යාර්ථය හා එය ඉදිරිපත් කිරීමෙහි ලා සාහිත්‍යය රචකයා වහල් කර ගන්නා භාෂා රීතිය, සන්දර්භය, චරිත, රිද්මය, රචනා උපක්‍රම යනාදී සියල්ල සමාජ අවශ්‍යතාවයන්ට අනුව සකස් වූව කි. ඒ අනුව අදාළ සමාජයේ අවශ්‍යතාවලට අනුව එම සමාජය නියෝජනය කරන සංස්කෘතික පාර්ශ්ව ද විවිධ වෙනස්වීම්වලට භාජනය වේ. ඇතැම් අවස්ථාවල දී සාහිත්‍යයෙන් නිරූපණය වනුයේ එකී සමාජ අවශ්‍යතාවන්ට අනුකූල ව සිදු වූ සංස්කෘතික විපර්යාසය බව අදාළ සාහිත්‍යය මූලාශ්‍ර විචක්ෂණශීලීව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වේ. කිසියම් සාහිත්‍යය නිර්මාණයක ස්වභාවය තත් යුගයේ අවශ්‍යතාවය අනුව වෙනස් වන අතර නව යුගයක උදාව ත් සමඟ සාහිත්‍යය ද කාලානුරූපී ව වෙනස් බව හා එය සංස්කෘතියේ වාහකයා මෙන් ම එහි අනුප්‍රාණය බවට ද පත් වන බව චන්ද්‍රසිරි පල්ලියගුරු සඳහන් කරයි. (පල්ලියගුරු,1992:17)

දඹදෙණි අවධියේ දී රචිත බුත්සරණ තුළින් අවධාරණය කෙරෙන්නේ හින්දු භක්තිවාදය හිස එසවෙමින් ගොඩනැගුණු හින්දු සංස්කෘතිය මුල් බැස ගත් සමයක බුද්ධත්වය දේවාතිදේව වූ බ්‍රහ්මාති බ්‍රහ්ම වූ අසහය ඵලය බව හුදී බෞද්ධ ජනයාට පැහැදිලි කර දීමට ය. එක් දහස් නවසිය පනස් හයේ දී රචිත වික්‍රමසිංහයන්ගේ "විරාගය" නවකතාවෙන් නිරූපණය කෙරෙන්නේ වාණිජවාදය ප්‍රවේශ වූ සමාජයක සිදු වන සංස්කෘතික විපර්යාසයට මැදි

වෙමින් ජීවත් වන සියුම් වින්දන ශක්තියකින් යුතු මිනිසුන්ගේ මානසික ක්‍රියා කලාපය ය. මෙහි දී ප්‍රමුඛත්වය හිමි වනුයේ පුද්ගල මානසික යථාර්ථවාදය ගවේෂණය කරමින් වර්තමාන මානව ජීවිතයේ ගැබ් ව පවතින ජටිලත්වය නිරූපණය කිරීමට වුව ද එහි යටි පෙළින් නිරූපණය වන්නේ වාණිජවාදය ප්‍රවේශ වූ සමාජයක සිදු වන සංස්කෘතික විපර්යාසය මිස අන් කවරක්ද?

සාහිත්‍යය අධ්‍යයනයේ දී කිසියම් නිර්මාණයකට පසුබිම් වූ සමාජ පරිසරය, එහි වෙසෙන්නන්ගේ සිතුවිලි හා අන්‍යොන්‍ය සම්බන්ධතා ආදි වූ කරුණු රැසක් කෙරෙහි සාහිත්‍යකරුවාගේ මෙන් ම සහෘදයාගේ නිර්මාණාක්ෂිය විශේෂයෙන් ම යොමු වේ. කලින් කලට සිදු වන සමාජ පරිණාමය ත් සමඟ ම පුළුල් ලෙස විපර්යාසයනට නතු වන සංස්කෘතික පැතිකඩ ලෙස සැළකෙන නාගරීකරණය, කාර්මීකරණය හෙවත් නවීකරණය, ගෝලීයකරණය හෙවත් විශ්ව ගම්මාන සංකල්පය, සාම්ප්‍රදායික ස්ත්‍රී, පුරුෂ භූමිකාවේ සිදු වූ විපර්යාසය, අධ්‍යාපනය, දේශපාලනය, ආගම, කුල ක්‍රමය යනාදී ස්ථාපිත සමාජ සංස්ථාවන්හි සිදු වන විපර්යාසය ආදී යථෝක්ත කාරණා තත් යුගයන්හි සාහිත්‍යකරණයේ නිරත වූ සාහිත්‍යධරයන්ගේ නිර්මාණ සඳහා මූලාශ්‍ර සපයා ඇති බව පැහැදිලි ය"සාහිත්‍යය කලා පහළ වනුයේ රටක සමාජීය , සංස්කෘතික, ඓතිහාසික, ආර්ථික ආදී විවිධ බලවේග පසුබිම් කර ගෙන ය. මේ සිද්ධාන්තය නො සළකා කෙරෙන සාහිත්‍යය කලා අධ්‍යයනය අසම්පූර්ණ ව්‍යායාමයක් වන්නේ ය" යනුවෙන් චන්ද්‍රසිරි පල්ලියගුරු සඳහන් කරන්නේ එහෙයිනි. (පල්ලියගුරු,1992:17)

කිසියම් යුගයක සාහිත්‍යය සෘජු ව හෝ වක්‍ර ව හෙළිදරව් කරන්නේ එම යුගයේ පවතින අධිපති ආකල්පයන් මඟින් ඉස්මතු වන තත් යුගයේ සංස්කෘතික විපර්යාසය යි. කිසියම් යුගයකට අයත් නිර්මාණකරුවෝ එම යුගයේ සංස්කෘතික නිෂ්පාදන වෙති. කවිය මෙන් ම නවකතාව, කෙටිකතාව, සිනමාව ආදී සෑම සාහිත්‍යය මූලාශ්‍රයකින් ම නිරූපණය වන සර්වකාලීන අනන්‍යතාවය එය යි.

එක් දහස් නවසිය අසූව දශකයේ ආරම්භය ත් සමඟ සංවර්ධනය හා නවීකරණය සමාජය පුරා පැතිර ගියේ ඉතා සීඝ්‍රයෙනි. මෙම තත්වය හමුවේ සාම්ප්‍රදායික සමාජීය ජීවිතය විෂයෙහි කිසිදු බලාපොරොත්තුවක් තබා ගත හැකි වූයේ නැත. මෙම අවධියේ බිඳ වැටුණු සමාජ සංස්කෘතික ක්ෂේත්‍රය තවදුරට ත් අර්බුදයක් කරා ගෙන යනු විනා වෙනත් විකල්පයක් පෙනෙන මානයක පැවතියේ නැත. එනයින් සමස්තයක් ලෙස මෙම දශකයෙන් ඇරඹෙන කාල වකවානුව දේශපාලන, ආර්ථික හා සමාජීය අතින් පසුබෑමකට ලක් වූ අවධියක් ලෙස හඳුන්වා දීම අතිශයෝක්තියක් නො වේ. මේ හේතුවෙන් මේ දශකයේ බිහි වූ කිසිදු සාහිත්‍යය කලා කෘතියකට එකී රෝගී භාවය ස්පර්ශ නො කර සිටීමට හැකි වූයේ නැත. එ සේ ම උක්ත යුගයේ ආරම්භය ත් සමඟ ම පැරණි සාම්ප්‍රදායික ආගමික දෘෂ්ටිවාදයන් අභියෝගයකට ලක් වූ අතර සාහිත්‍යය කලා ක්ෂේත්‍රයට ද එහි කම්පනය දැනෙන්නට විය.

එක් දහස් නවසිය අසූව දශකයෙන් ඇරඹෙන සාහිත්‍යය යුගය අරඹයා සිදු කළ මෙ බඳු අධ්‍යයනයකින් ද යළි යළි ත් තහවුරු වනුයේ සාහිත්‍යය, කලාව හා සමාජය අතර පවත්නා අපෝහකාත්මක සම්බන්ධතාව යි. මේ යුගයේ ආර්ථික, දේශපාලන හා සමාජීය

සංසටකයන්ගේ යථාර්ථය කවියෙන් පිළිබිඹු වීම වැළැක්විය නො හැකි වී ඇත්තේ එ බැවිනි. අන් කිසිදු යුගයකට වඩා මෙම යුගයේ කවියෙන් සමාජානුභූතීන් හා සමාජානුබද්ධ තේමාවන් ප්‍රතිනිර්මාණය වී ඇත්තේ ද එ බැවිනි. යට දැක් වූ ආර්ථික, දේශපාලන, සමාජ වෙනස් වීම් හේතුවෙන් සිදු වූ සංස්කෘතික විපර්යාසයන්තත් යුගයේ කවියට ප්‍රස්තුත වූ ආකාරය ද මැනවින් පිළිබිඹු වේ

ගෝලීයකරණය හා කාර්මීකරණය යටතේ අන්‍ය සමාජ ක්‍රම අනුගමනය කිරීම හා නව දැනුම තත් සමාජවලින් ලබා ගෙන එ මඟින් තම සමාජ ප්‍රපංචය ඉහළ නංවා ගැනීමට බොහෝ දෙනා උත්සාහ ගනිමිනි සිටී. තාක්ෂණය උරා ගෙන තමන්ගේ තත්වය දියුණු කර ගැනීමට ගන්නා වූ උත්සහය රටවල් අතර මෙන් ම එහි ජීවත් වන්නවුන්ගේ ද ලක්ෂණය කි. එම්. එන්. සිරිනිවාස් දැක් වූ සංස්කෘතිකරණය හා බටහිරකරණය ද මීට කදිම නිදසුන කි. සමස්තයක් ලෙස ගතහොත් පුද්ගලයින් සමූහ වශයෙන් සමස්ත සමාජ ධූරාවලියේ ඉහළ ස්ථරයකට ප්‍රවේශ වීම සමාජ වෙනස්වීම්වලට නිදසුන කි. (Sirinivas,1992:62,69)

සමාජය නවීකරණය වීම ත් සමඟ ම ග්‍රාමීය කුටුම්භ ජීවිතයෙන් ඈත් ව ජනතාව නගරයට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් ඇති විය. තම දරුවන්ගෙන් වියෝ වීම හේතු කොට ගෙන මව්පියෝ ගමෙහි වූ ඔවුනගේ ස්ථිර නවාතැන්පොළෙහි හුදෙකලා වෙති. මෙ ලෙස දරුවන්ට ද තම ගමෙහි විසූ මව්පියන් අතහැර ගොස් හුදෙකලා ජීවිතයකට හුරු වීමට සිදු වූයේ මෙම සමාජ නවීකරණ ක්‍රියාවලිය ත් සමඟ ම එයට හැඩ ගැසීම ඔවුනගේ ජීවන පැවැත්ම උදෙසා අනිවාර්ය කාරණයක් වූ බැවිනි. ගමේ අක්මුල් සිඳුණු දරුවන්ට වුව මව් සෙනෙහස පසක් වුවද පවත්නා ආර්ථික අඟ හිඟතා ඔවුනට බාධකය කි. එම දරුවන්ට මව්පියන්ගේ අගය සිහිකොට ළතැවෙනු විනා කළ හැකි අන් දෙයක් නො වේ. රත්න ශ්‍රී විජේසිංහයන්ගේ "අම්මේ පෙම්බරා" නම් කවි පෙළ යට කී අනුභූතිය රැගත් නිර්මාණය කි.

"මැනලා වී දෙකක් නො ලැබී මල්ලකට
දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
ඇහුවා මගෙ පුතේ කිරි ඕනැ ද උඹට" (විජේසිංහ,1985:19)

දරුවන්ගේ ජීවිතවල පවත්නා දුක් කරදර මව්වරු ඉවෙන් මෙන් දැන ගනිති. තම දරු පැටව් සමඟ අප කථකයා නගරේ ඔහුගේ නවාතැනෙහි හුදකලා වී ඇත. ඔහු පවසන ආකාරයට මවට සැබෑ ලෙස ම ඔහු කරා පැමිණීමට ඉඩ ප්‍රස්ථාවක් නොමැති හෙයින් ඇය හීනෙන් විත් ඔහුගේ දුක සැප විමසයි. කවියා මෙහි දී අන්ධකාර රාත්‍රිය ලෙස යොදා තිබෙන්නේ ඔහුගේ ඉතාමත් කර්ණ කටුක ජීවිතය සංකේතවත් කිරීමෙහි ලා විය හැකි ය. තද කළුවරෙහි දිස් වන සුදු වර්ණය එම අන්ධකාරය පරයා නැඟී සිටියි. මෙහි දී කවියා නිර්මාණයේ දී එන කතකයාගේ දුක්ඛිත ජීවිතය නැමති අන්ධකාර රාත්‍රියෙහි පිපී බබළන සුදු රෝස මල වන්නේ ඔහුගේ මව ය. මව් තුරුලෙන් මිදී නගරයේ මුල් බැස ගත් දහසකුත් දරුවන්ගේ චින්තනය කෙරෙහි කවියා එබී බැලීමට සමත් වී ඇති අයුරු සැබවින් ම අගය කටයුතු ය.

එක් දහස් නවසිය අසූව වර්ෂය වනාහී සමාජ නවීකරණ ක්‍රියාවලියෙහි ලා ඉදිරි පිම්මක් පෙන්නුම් කළ අවධියක් බව පැහැදිලිය. එවකට සමාජ, දේශපාලන, ආර්ථික, ආගමික, අධ්‍යාපනික, සංස්කෘතික ආදී සෑම ක්ෂේත්‍රයක් ම ඉතා සූක්ෂම ලෙස විමසුමට ලක් කිරීමේ දී දක්නට ලැබෙන්නේ මේ සියළු ක්ෂේත්‍රවල අවනතිය කි. විශේෂයෙන් ම සංස්කෘතිය එහි ප්‍රබල බලපෑම්කාරකයක් බවට පත් වී ඇත. සමාජ නවීකරණ ක්‍රියාවලියෙහි ලා කිනම් අංශ දියුණුවට පත් වුව ද නොයෙකුත් හේතු සාධක මත එහි අනිටු ප්‍රතිඵල ස්වභාව ධර්මයට විඳින්නට සිදු වේ. සොබා දහමේ විනාශය සිදු වුවහොත් එහි අනිටු ප්‍රතිඵල විඳින්නට සිදු වන්නේ මිනිසාට ම බව අවබෝධයෙන් යුතු ව සමාජ නවීකරණ ක්‍රියාවලියෙහි ලා මිනිසා ක්‍රියාත්මක විය යුතු ය. එරික් ඉලයප්ආරච්Ñ "කැළණි ගඟ" නම් නිර්මාණය යථෝක්ත කාරණයට දෙස් දෙයි.

"තවුස් ගති උරා ගෙන ඉවුරු මැද නිදා ගෙන
දිය කඳම අවදි වෙයි උතුරනා කෝපයෙන්
නො නිමි බිය දෝර ගිය ඉවුරු වට ගම්මාන
දියෙන් යට වී අඬයි වැසි වැටෙන අඳුරු මැද" (ඉලයප්ආරච්චි, 1981:11)

කවියා ප්‍රකාශ කර ඇති ආකාරයට කැලණි නදිය මෙම වියරුවට පත් වීමට පෙර තවුසෙකුගේ ස්වරූපය ආරූඪ කර ගෙන සිටියේ ය. ඉන් ධ්වනිත වන්නේ නදියෙහි වූ නිස්කලංක, පවිත්‍ර දැමුණු ස්වරූපය යි. නමුත් සමාජ විපර්යාසයන් දිනෙන් දින උග්‍ර අතට පත් වීම ත් සමඟ ම එම තත්වය දරා ගත නො හැකි ව වියරුවට පත් වූ නදිය අවට ගම්මාන සියල්ල ගිල ගනිමින් මහත් විනාශයක් සිදු කරයි. මෙහි දී කතකයා නදියෙන් අසන ප්‍රශ්නය වනුයේ මෙ තරම් සංහාරයක් සිදු කිරීමට තරම් නදිය වියරුවට පත් වූයේ කුමන හේතුවක් නිසා ද යනුවෙනි. එහෙත් පසුව මෙ තරම් සංහාරයක් සිදු වීමට මූලික ම හේතුව සමාජ නවීකරණය ත් සමඟ ම මිනිසුන් ගත කරන විනාශකාරී දිවි පෙවෙත බව කවියා තමා විසින් ම අවබෝධ කර ගනී.

"ලෑලි දොර මඳක් ඇර තොල් පටින් කිති කවා
මඟ යනෙන රජවරුන් නෙත් කොනින් අඬ ගසා
පියොවුරින් පියොවුරට ඔවුන් සැම මාරු කර
අප ගෙවන දිවිය දැක උරණ වූයෙ ද නදිය ?" (ඉලයප්ආරච්චි, 1981:11)

මෙ බඳු මහත් විපත්තියක් සමාජයේ සිදු වුව ද එය සමාජයේ දේශපාලඥයින්ට, පාලකයින්ට සැළකිය යුතු කාරණයක් නො වේ. සමාජය කෙතරම් නවීකරණයට පත් වුව ද කැලණි ගඟ අසබඩ දිවි ගෙවන මුඩුක්කුවාසී දුගී ජන ජීවිතයේ නම් කිසි ම නවීකරණයක් සිදු වී නොමැත. කැලණි නදිය පිටාර ගැලුව ද සමාජ නවීකරණයේ ප්‍රතිඵල ලෙස බිහි වී ඇති සුවිසල් මන්දිරවල සුඛෝපබෝගී දිවි ගෙවන්නෝ එම මහා ජල සංහාරයට බිලි වන්නෝ නො වෙති. මෙ බඳු විපතක දී පාලකයන් සිදු කරනුයේ පැල්පත්වාසීන් සමීපයට ගොස් ඔවුනගේ ලෑලි දොරවල් අතරින් එබී බලා ජනතාව සනසනු පිණිස ඔච්චම් කතා කීම පමණි.

සමාජ සචලතාව හෙවත් චල්‍යතාව යනු සමාජ වෙනස්වීම යි. එය කලින් පැවති, තවදුරට ත් දැකිය හැකි වෙනස්වීම්වලට ලක් වූ හා වෙනස්වීම්වලට ලක් වෙමින් එක් සමාජ ස්ථරයක සිට තවත් සමාජ ස්ථරයකට ප්‍රවේශ වීමක් ලෙස ත් දැක්විය හැකි ය. මානව වර්ගයා අතර සම්බන්ධතා ආරම්භ වූ දා සිට ම එහි වෙනස් වීමක් දක්නට තිබුණි. සමාජයට පමණක් නො ව සෑම පද්ධතියකට ම සම්බන්ධ මෙහි වෙනස්වීම් පිළිබඳ ව අතීතයේ සිට ම විවිධ දාර්ශනිකයන් හා විද්වතුන් අදහස් පළ කර ඇත. වෙනස්වීමක් යනු දිගු කාලීන ව සිදු වන වෙනස් වීම ය. ග්‍රීක දාර්ශනිකයෙකු වූ හෙරක්ටලීස් වරෙක ප්‍රකාශ කළේ, "මිනිසා එක ම ගඟකට දෙවරක් බසින විට මිනිසා ත්, ගඟ ත් දෙක ම වෙනස් වී ඇත" (පෙරේරා,1993:87). යනුවෙනි. මේ අනුව වෙනස් වීම ස්වාභාවික වූ ත්, අනිවාර්ය වූ ත් ක්‍රියාදාමයක් ලෙස සැලකිය හැකි ය. කවිය, මමත්වයෙන් තොර සංවේදී ජීවිතය හා යථාර්ථය පදනම් කර ගත් නිර්මාණයක් විනා දේශපාලන දහමක, ආගමික මතවාදයක හෝ දාර්ශනික සංකල්පයක මෙහෙයවීමෙන් නිම වූවක් නො වන බව සඳහන් කළ යුතු වුව ද කවිය මඟින් සමාජ ව්‍යුහයක බල පවත්නා දේශපාලනික, ආගමික, අධ්‍යාපනික, සංස්කෘතික ආදී ස්ථාපිත සමාජ සංස්ථාවන්හි සිදු වන වෙනස නිරූපණය වන බව කිව මනා ය.

අසූව දශකය වනාහි ශ්‍රී ලාංකික සමාජය කම්පනයට පත් කළ භීෂණ යුගය කි. එම කුරිරු සමාජ තත්වය නූතන සිංහල කවියට පුළුල් ලෙස බලපා තිබේ. යුද්ධය හා භීෂණය පිළිබඳ නිර්මාණයක් නො කළ නූතන කවියෙකු නොමැති තරම් ය. අසූව දශකයේ සමාජය වෙළා පැවති භීෂණයට තරුණ තරුණියන් මෙන් ම සමාජයේ වැඩ විසූ තරුණ භික්ෂූහු ද ගොදුරු වූහ. මෙ සේ භීෂණයට ගොදුරු වූ තරුණ භික්ෂුවක පිළිබඳ පුවත රත්න ශ්‍රී විජේසිංහයන්ගේ "අසිරිමත් ථේර ගාථාව" නමැති රචනයට අනුභූති සපයා ඇත.

"රැව් නැගුණ වෙඩි හඬ පිට පිට
රීරි සොයන මාර සෙනඟ
ගිජිකුළු පච්චක් බඳු ට්‍රක් රථයෙන් බැස
වහසි කියා මරහඬ ගා
තුවක්කු ගෙන කඩා වැදුණ විහාරයට
පුංචි හාමුදුරුවෝ හෙමිහිට
ආවාසෙන් එළියට බැස
රැළි නගන කහ සිවුරු පට-මැද සිට
විමසුවා ශාන්ත ව
"ඇයි ද මොක ද මහත්වරුනි
කාරනාව . . . . ? " ...
සර්වඥ ධාතූන් වැඩ සිටින
ත්‍රිපිටකය සජ්ඣායනා කෙරුණ
රජ මහා විහාරය සැලුම් දෙදරුම් කෑය"

(විජේසිංහ, 1985:49)

මෙහි සඳහන් වන තරුණ හිමියෝ යුක්ති ගරුක ව සාධාරණය අපේක්ෂාවෙන් කතා කරති. එහෙත් මේ භීෂකයන්ට උන්වහන්සේගේ ප්‍රශ්න කිරීම් නෑසේ. ඒවාට පිළිතුරු ලැබෙන්නේ වචනයෙන් නො වේ. වෙඩි උණ්ඩවලිනි. මෙහි දී ප්‍රබල ව ඉස්මතු වන කාරණය වන්නේ පටු දේශපාලන හා අන්තවාදී අරමුණු හේතුවෙන් සමාජයේ සංස්කෘතිය කෙතරම් පරිහානියට පත් වී ඇත් ද යන්න ය. මුතුකුඩ යට දවුල්, නලා, සිංගාරම් නාද මධ්‍යයේ වඩින උන්වහන්සේට මෙ වර ඒ ගරු සැලකිලි නැත. මේ මාර සෙනඟ කටර් අඬුවලින් ඇද උන්වහන්සේගේ හිස කෙස් උගුල්ලති. ඇඟිලි තුඩු අග අල්පෙනෙති ගසති. නියපොතු තලා සත්‍යයේ ප්‍රාණය සොයති. අවසානයේ ටයර් සෑයකට උන්වහන්සේ බිලි දෙති. මේ භීෂකයන්ගේ රළු වේෂය ත්, ප්‍රචණ්ඩත්වය ත් කදිමට චිත්‍රණය කරන රත්න ශ්‍රී කවියා ළෙහි පපුකම් නැති ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය වැලලී ගිය සමාජයක සංස්කෘතික වියරුව කවියෙන් ගවේෂණය කරයි.

එක් දහස් නවසිය අසූ තුනේ කලු ජූලිය තේමා කර ගෙන නන්දන වීරසිංහ කවියා විසින් රචිත මතු සඳහන් නිර්මාණය වාර්ගික අරගලයෙන් වැසී ගිය මිනිසත්කමේ අගය මැනවින් පෙන්වා දෙන්න කි.

"මිනිස් කටහඬක් නැත ලවන සුළගේ ඇදෙන
සවන් ළඟ ගැහෙන නුඹ වදන් බිඳි බිඳී වැටෙන
ජූලියේ ගිනි නැගෙන පියසි පිසගෙන හමන
සුළඟට ද ඉව තියේ අසිංහලයන් දකින" (වීරසිංහ, 1984:14)

ශ්‍රී ලංකා ඉතිහාසයේ සිදු වූ අවාසනාවන්ත හා කණගාටුදායක සිදුවීමක් වන, නිරායුධ දෙමළ වැසියන් ඉලක්ක කර ක්‍රියාත්මක කළ "කළු ජූලිය" දෙමළ විරෝධී කැරැල්ලක් විය. මෙම ඉතාමත් සාහසික ම්ලේච්ඡ සිදු වීම හේතුකොට ගෙන තත් යුගයේ විසූ මිනිසුන්ගේ ජීවිත මුළුමනින් ම මහත් විපර්යාසයකට ලක් විය. යථෝක්ත සිදු වීම කාව්‍යානුභූති කොට ගනිමින් නන්දන වීරසිංහයන්ගේ මෙම පද්‍ය නිර්මාණය මගින් පදනම් විරහිත ව විනාශ මුඛය කරා ඇදෙන මිනිස් සංහතිය හා බැඳී ගත් සංස්කෘතිකමය සභ්‍යත්වය පිළිබඳ ව මැනවින් විවරණයකට ලක් කොට ඇත්තේ පාඨක සිත කම්පනයට පත් කරවමිනි.

මන්නාරමේ වෙරළ තීරයකට විත් රාත්‍රිය විඳිමින් සිටින කවියා සමාජයේ වෙලා පවත්නා බේදවාචකය පිළිබඳ ව ස්මරණය කරයි. රාත්‍රියේ දී හමන මුහුදු රළ රැයෙහි මන්නාරම් කතර දෙදරවමින් නැගී එන ආකාරය කවියා දකින්නේ සමාජයේ උද්ගත වී ඇති මෙම අවාසනාවන්ත ඉරණමට මැදි ව අසරණ ව සිටින මිනිස් සංහතියේ විරහාලාපයක් ලෙසිනි. මන්නාරම් වෙරළ තීරයේ හමන ලවන සුළඟෙහි මුසුවන්නට එකදු මිනිස් කටහඬක්ව ත් ඔහුගේ සවනත ගැටෙන්නේ නො වේ. ඒ මක් නිසා ද යත් මීට මතු කාලෙක මන්නාරම් පෙදෙස පුරා ගැවසී සිටි දමිළ ජන සමූහයේ කිසිවෙකු ත් මේ වන විට එම ප්‍රදේශයේ නො වීම ය. ජීවන අරගලය පතා ඔවුහු සැඟ වී ගොස් ඇත. බහුතරයක් දමිළ ජනතාව මන්නාරම් වැල්ල මතුයෙහි සාමදාන ව වැළලී ගොස් සිටිති. මව, පියා දරුවන් සියල්ල ඉතා සතුටින් දිවි ගෙවූ පැළ තුළ ම ඔවුන්ගේ දේහ දැවෙන සෑය නිම වී ඇති බව

පවසන කවියා මිනිස් සංහතියේ සිදු ව ඇති විපර්යාසය පිළිබඳ සමාජ කතිකාව කට බඳුන් කොට ඇත්තේ පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ ව දැඩි පිළිකුල් සහගත හැඟීමකිනි.

"මා පියා නෑසියන් ඉපිද දැඩි වූ තැන ම
දර සෑය වී එ තුළ වුන් දැවෙන බව සිහි ව
ඔබ හඬන හඬ මුහුද දෙන ලතෝනිය සම ව
ඇසෙන්නේය රැය දිගය අරුණ නො දකින සේය" (වීරසිංහ, 1984:14)

අවිචාරවත් වර්ගවාදයේ කුරිරු විනාශය ඉතා සංයමයකින් ඉදිරිපත් කරන මෙම කවියා ඉකි බිඳින මිනිසත්කමේ රාවයෙන් සහෘද සිත් අවදි කරවයි. අවසන මේ උමතුව පිළිබඳ ව ඔහුගේ දෘෂ්ටිය ගෙනහැර දක්වන්නේ සියුම් උපහාසයකින් ද යුක්තව ය.

සාම්ප්‍රදායික කුල ක්‍රමය වනාහි සමාජ වෙනස්වීම ත් සමග නිරන්තරයෙන් උස් පහත් අන්දමින් වෙනස් වන සමාජ සිද්ධාන්තය කි. ඉහත සඳහන් අයුරින් සමාජය සීඝ්‍රයෙන් වෙනස් වුව ද යථෝක්ත කාරණය නම් එබඳු වෙනස්වීමකට භාජනය වී නොමැති සෙයක් පෙනී යයි. සමාජයේ වෙසෙන ඇතැම්හු තම පරම්පරාවෙන් උරුම වූ තමා අයත් කුලයේ වෘත්තීන්වල නිරත වනුයේ ආත්ම ගෞරවය පවා නො තකමිණි. රත්න ශ්‍රී විජේසිංහයන්ගේ 'ශුද්ධාත්ම' ඒ අරභයා ලියවුණු නිර්මාණය කි. සාම්ප්‍රදායික ව රෙදි සෝදන ස්ත්‍රියක කෙරෙහි ස්වකීය කවි ඇස යොමු කරන කවියා ඇගේ ජීවිතය කුල ක්‍රමය මත පදනම් ව පීඩනයෙන්, වේදනාවෙන් මිරිකී ඇති ආකාරය දෘශ්‍ය චිත්‍රයකට නගයි.

"ලෙංචිනා" නම් මෙම ස්ත්‍රියගේ රම්‍ය වූ යෞවනය වෙල්ලාව සමීපයේ දිය වී යන ආකාරය කවියා ප්‍රතිනිර්මාණය කරන්නේ මානව භක්තියෙන් ආඪ්‍ය වූ මෙන් ම, මෙම සාම්ප්‍රදායික සමාජ ක්‍රමය පරිණාමයට පත් කළ යුතු ය යන අදහස ඇති කවි සිතකිණි.

"කැක්කුමයි තුනටිය නමා
අත්පා රුදා දෙයි වෙවුළුවා
කැස්ස මතු වී දොස් කියන විට
පපුව අතගා ගන්නවා
අත්ත - මුත්තල ගේ පටන්
කළ පේඩිකම් ඉවසා දරා
සත්තකයි මේ තරම් කිලිකුණු
ඇද්ද රට නුඹ සිතනවා" (විජේසිංහ, 1988:14)

මෙ ලෙස ලෙංචිනාගේ ජීවිතය හාත්පස පැතිර ඇත්තා වූ කටුක, කර්කෂ දුක්ඛ දෝමනස්සයන් මෙන් ම ඇය අභාග්‍යයේ ඉරණමට ගොදුරු ව සිටින අයුරු කවියා දකී. ඒ ඇයට ගතානුගතික සාම්ප්‍රදායිකත්වයෙන් ගැලවීමක් නැති බැවිනි. සමාජය කෙතරම් චලිතවීමකට භාජනය වුව ද මෙ බඳු කාරණාවන් නම් යම් තාක් දුරකට හෝ සමාජය වෙලා පවත්නා බව කිව මනා ය.

ගතානුගතික සාම්ප්‍රදායික සමාජ ක්‍රමයක කාන්තාවට උරුම ව තිබූ තත්වය නූතනය වන විට මුළුමනින් ම විපරිණාමය වී ඇති බවක් විද්‍යමාන වේ. සමාජ නවීකරණය ත්, වාණිජකරණය ත් සමඟ ම කාන්තාව ද විවිධ වෙනස්වීම්වලට බඳුන් ව ඇති සෙයක් පෙනේ. එක් දහස් නවසිය අසූව දශකයේ කවි යුගයේ දී කාව්‍යකරණයේ නිරත වූ බහුතරයක් කවීන්ගේ කාව්‍ය නිර්මාණවලින් යථෝක්ත කාරණය මොනවට පසක් වෙයි. නූතන සමාජයේ ස්ත්‍රියට සිදු වන අනේක විධ සමාජ අයුක්තිය, අවනීතිය හමුවේ ස්ත්‍රිය විඳින දුක් ගැහැට රත්න ශ්‍රී විජේසිංහයන්ගේ කාව්‍ය නිර්මාණ අතරේ බහුල ව විද්‍යමාන වන්න කි. කවියා සංවේදී සමාජ නිරීක්ෂකයෙකු වන නිසා ම නගරයේ ද, ගමේ ද, මඟ තොටේ ද මෙන් ම වතුකරයේ ද වන එ බඳු ස්ත්‍රී චරිත ඔස්සේ ඔහුගේ කාව්‍ය ලෝකය පෝෂණය කරයි. මතු දැක්වෙන්නේ වතුකරයේ දළු නෙලන ස්ත්‍රියකගේ වේදනා බර ජීවිතයේ අංශු මාත්‍රය කි. කවියා වතුකරයේ ගැහැණිය සරස්වතී දෙවඟන සමඟ සංසන්දනය කරමින් ප්‍රබල උත්ප්‍රාසයක් ද අපූර්වත්වයක් ද ගෙන හැර දක්වයි.

"කිඩාරම් කමලාසනේ
දාඩියේ ලුණු රස ජලාසේ
දුක් ගායනා - වෙණ වාදිකා
අම්මේ! සරස්වතී දෙවියේ" (විජේසිංහ, 1985:38)

දළු නෙලන මේ ගැහැනිය සරස්වතී දේවිය මෙන් ජලාශයේ කමලාසනයක් මත වැඩ සිටින චාරු දේහිනියක නො වේ. ඇය මළපොත පවා දැක නැති, දුක ම අනුභව කරමින් සිටින කණකොකා හැඬූ ජීවිතයක උරුමක්කාරිය කි. ඇයට උරුම ව ඇත්තේ සරස්වතී දේවියගේ මෙන් පද්මයන්හි ස්පර්ශ වන පාද පතුල් නො වේ. ඇගේ දෙපතුල් වතුකරයේ ඇති තේ උල්වල ගැටී පැළී වණ වී ඇත. ඒ මන් ද යත් සෙරප්පු යුගළයකින් හෝ තම පාද ආවරණය කර ගැනීමටව ත් ඇයට වත්කමක් නො වීම හේතුවෙනි. ඇගේ සැමියා ද කම්කරුවෙකි. කවියා පවසන අන්දමට කම්හලේ ගල් රෝලට ඔහුගේ අත හසු ව ඔහු ද ඔවුනගේ නවාතැන වූ ලැයිමේ ලෙඩ ඇඳේ පසුවෙයි. එ බැවින් පවුලේ කුසගිනි නිවීමේ බර පැටවූයේ මෙම අසරණ කාන්තාව මත ය. අවසානයේ ඇය කෝවිලේ දෙවියන්ගෙන් ආයාචනා කර සිටිනුයේ කොවිලේ තිරයකට මුවා වී නො සිට එළියට මතු ව විත් ඇයට සරණක් වන ලෙසට ය.

ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ සිදු වන වෙනස් වීම්/විපර්යාසයන් එදා මෙදා තුර සිට ම සිංහල කවියට වස්තු විෂය වූ මාතෘකාව කි. එක් දහස් නවසිය අසූව දශකය වන විට විශ්වවිද්‍යාල තුළින් උපාධිධාරීන් විශාල වශයෙන් පිට වන්නට විය. එහෙත් ඔවුනට සුදුසු රැකියාවක් ලැබුණේ කලාතුරකිනි. එ බඳු උගත් උපාධිලාභී තරුණයෙකුගේ ජීවන අත්දැකීමක් රත්න ශ්‍රී තම 'සිරි කාලකණ්ණි' නම් කාව්‍ය නිර්මාණය සඳහා පාදක කොට ගෙන ඇත.

"දිනා තක්සලාවේ නායක කුමරු
මනාප වී තහනම් පලයට මහරු
නැගී ගසින් බැස-ගම රට යන අයුරු
උදුම්බරාවන් නාඳුනති ද නුවරු" (විජේසිංහ, 1985:39)

මෙම පද්‍ය නිර්මාණයේ රූපිත තරුණයා උපාධිය ලබා පැමිණ රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතේ කම්කරුවෙකු වී පාර කපයි. ඔහු අසලින් යතුරු පැදියකින් ගමන් කරන ඔහුගේ පැරණි පෙම්වතිය ඔහුට සමච්චල් කරන සෙයක් පෙනේ. තම උපාධියට සරිලන රැකියාවක් ලබා ගැනීම අද මෙන් ම එද ත් තරුණ තරුණියන්ට ගැටලුවක් ව පැවති බව මින් පැහැදිලි වේ. මෙ බඳු සිදුවීම් මඟින් සිදු වනුයේ රටේ උගත් තරුණ පරම්පරාවට තමා පිළිබඳ ව ඉච්ඡාභංගත්වයක් ඇති වීම යි. මෙම තත්වයේ භයානක ම ඛේදවාචකය වූයේ 88,89 කාල වකවානුව තුළ තරුණ තරුණියන් රජයට විරුද්ධ ව කැරලි ගැසීම යි.

ධනේෂ්වර සමාජ ක්‍රමය ආගමනය ත් සමඟ ම එතෙක් පැවති සමාජ ප්‍රපංචයන් දැඩි ලෙස අභියෝගයට ලක් විය. එය සුභවාදී ද අසුභවාදී ද යන්න වෙන ම ම සාකච්ඡාවට බඳුන් කළ යුතු ය. කෙ සේ වුව ද කාන්තාව හා පුරුෂයා පිළිබඳ ව වන ප්‍රතිරූපය ධනවාදී සමාජයේ අභියෝගයට ලක් වීම පිරිමියා මෙන් ම යුගයේ කාන්තාව ද අතිශයින් ම කම්පනයට පත් කළ තත්වය කි. ඒ අනුව යුගයේ බල පවත්නා ආර්ථික, දේශපාලන හා සමාජ පසුබිම මත ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම තමා වෙළා සිටි සාම්ප්‍රදායික භූමිකාවෙන් මිදී නූතනත්වය හා වාණිජත්වය සමඟ ගැටීමට සිදු විය.

නූතන සමාජ ක්‍රමය පිළිබඳ ව විචක්ෂණශීලී ව අවධානය යොමු කරලීමේ දී නිරන්තරයෙන් ඇස ගැටෙන කාරණයක් වන්නේ සියල්ල වාණිජකරණයට ලක් වූ සමාජ ක්‍රමයක ප්‍රේමය, ආදරය වැනි සචින්තනමය සංකල්ප ද එයට නතු වී ඇති බව ය. මෙම තත්වය වර්තමාන කවීන් තම කාව්‍ය සංකල්පනා සුපෝෂණය කර ගනු වස් භාවිත කළ අන්දම කාව්‍ය රචනා රැසකින් ම මොනවට පැහැදිලි වේ. ඒ සඳහා එක් නිදර්ශනයක් ලෙසට එරික් ඉලයප්පාආරච්චිගේ 'කිවිඳියකගේ බිඳුණු පෙම' නම් කාව්‍ය නිර්මාණය සැළකිය හැකි ය. මෙහි සඳහන් තරුණිය කිවිඳියක බවට පත් වූයේ ඇය තම සිත් ගත් ආදරණීය පෙම්වතා වෙනුවෙන්, ඇගේ ළෙහි ඔහු කෙරෙහි නිපන් බලවත් ආදරයේ නාමයෙන් ලියූ කවි, ගී හේතුවෙනි. හුදකලාව පැවති නිස්සාරණේ ගලා ගෙන ගිය ඇගේ ජීවිතය නෙක වර්ණයන්ගෙන් වර්ණවත් කළේ ඔහු මිස වෙනකෙකු නො වන බව ද ඇය පවසයි.

"කිඳුරු ජන්මේ උපන් මා ගැන
මඳින් මද අමනාප වූ ඔබ
අනගි රන් ආභරණින් සුසැදුණු
දිළෙන බිරිඳක් රැගෙන ආ සඳ
කිඳුරු දා කව සිතුවමක් කළ
මහ ද බෙද ද දැදුරු වුයෙ ය" (ඉලයප්ආරච්චි, 1981:12)

මෙම කාව්‍ය නිර්මාණයේ එන තරුණියට ඇගේ සදාදරණීය ප්‍රේමය අහිමි වීමට බලපාන මූලිකම හේතුව වූයේ ද ඇය දිළිඳු මවකගේ ත්, පියෙකුගේ ත් දියණිය බවට පත් ව සිටීම යි. ඇය මිල මුදල්, රන් අභරණ කිසිවකට ත් උරුමකම් නො කීව ද ඇය තම සිතෙහි තම පෙම් කුමරා වෙනුවෙන් තැනූ ප්‍රේම මන්දිරය සැබැවින් ම මිල කළ නො හැකි ය. ඇය තම සිතෙහි හටගත් සියලු දුක් අඳෝනාවන් විද දරා ගත්තේ ඒ සියල්ල කවිකමට පෙරළා ය. ඇගේ මෙම නැති බැරි කම, නො හැකියාව හේතුවෙන් අවසන දී ඇගේ පෙම්වතා ඇය ව අතහැර දමා යයි. ඇය වෙනුවට ඔහු අනර්ඝ වූ රන් ආභරණයන්ගෙන් සුසැදුම්ලත් බිරිඳක කැඳවාගෙන එයි. මෙ තෙක් කාලයක් මෙම අහිංසක අසරණ තරුණිය තම සියලු දුක් තනිව ම විඳ දරාගෙන සිට එය ඉක්මවා ලූ කල්හි ඇගේ හද නමැති බෙයද දෙදරවා ගිය බව කවියා පසක් කරවයි. එ මඟින් ඔහු මෙම සමාජ ක්‍රමයේ වූ අධමත්වයත්, සියල්ල මුදල් මත යැපීම හේතු කොට ගෙන මිනිසා හැඟීම් දැනීම් නොමැති යාන්ත්‍රණික සංකල්පයක් බවට පත් ව ඇති අයුරු ත් නිරූපණය කරනුයේ සහෘද සිත කම්පනයට පත් කරලමිනි.

## 6. සමාලෝචනය

"සංස්කෘතික විපර්යාසය හා නූතන සිංහල කවිය" යන මැයෙන් එක් දහස් නවසිය අසූව දශකය පාදක කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණාත්මක ලිපිය තත් යුගයේ සිදු වූ සංස්කෘතිකමය චල්‍යතාවන් යුගයේ සමාජ දේහය ස්පර්ෂ කළ ආකාරය පිළිබඳ ව සිදු කළ කතිකාව ක් ලෙසට අර්ථ දැක්විය හැකි ය. සංස්කෘතිය වනාහි මිනිසාගේ සමාජ ජීවිතය මෙහෙයවන ආර්ථික චර්යාව, සමාජ චර්යාව, දේශපාලන හා ආගමික චර්යාව, විනෝද කටයුතු, දැනුම, ආකල්ප, සදාචාර ධර්ම, විශ්වාස ක්‍රම, චින්තන ක්‍රම, කලාව, සාරධර්ම, නීතිය, සිරිත්, වෙනත් හැදියාවන්, ජීවන පුරුදු, ධර්මතා සහ අගනාකම් ආදී සියල්ලෙහි ම අන්තර්ගතය වේ. මෙකී අංග සියල්ලෙහි ම සිදු වන චල්‍යතාවයන් තත් යුගයේ සංස්කෘතික විපර්යාසය/වෙනස්වීමකෙරෙහි හේතු සාධක වේ.

කිසියම් සමාජ ප්‍රපංචයක කාලාන්තරයක් තිස්සේ පවත්නා සංස්කෘතික සත්ථාවන් විවිධ විපර්යාසයන්ට නතු වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වනුයේ ජනප්‍රිය සංස්කෘතියේ ආගමනය යි. සාම්ප්‍රදායික සිංහල දේශීය සංස්කෘතියට සුවිශාල බලපෑම්කාරකයක් ලෙස ජනප්‍රිය සංස්කෘතිය ආගමනය වී ඇත. නූතන යුගය වන විට කවිය, ගීතය, නවකතාව, කෙටිකතාව සිනමාව වැනි සාහිත්‍යාංග දක්වා ද ජනප්‍රිය සංස්කෘතිය බලපා තිබේ. මෙහි සුවිශාල ප්‍රවණතාවයක් දක්නට ලැබෙන්නේ මාධ්‍ය හරහා ය. සම්ප්‍රදායික සංස්කෘතිය ඕනෑම ජන සමාජයක පැවැත්ම සඳහා බලපාන තීරණාත්මක අංගය කි. සමාජයේ මූලික ව්‍යුහය සඳහා පදනම සැකසීමට වස්තු බීජ සපයනුයේ සම්ප්‍රදායිකත්වය යි. සමාජ ජීවියෙකු වශයෙන් මිනිසාගේ අතීතය නිර්වචනය කරමින් ඔහුගේ වර්තමානය සහ අනාගතය හැඩග ස්වන මූලාරම්භය ඔහු අයත් සම්ප්‍රදායික සංස්කෘතිය ම බව කිව මනා ය. නමුත් වර්තමානය වන විට ජනප්‍රිය සංස්කෘතියේ ආගමනය ත් සමඟ ම සම්ප්‍රදායික සංස්කෘතිය නො සළකා හැරීම හේතු කොට ගෙන අපගේ අනන්‍යතාවයට හානි පැමිණ ඇති බවට පිළිගැනීම යුක්ති සහගත ය.

එක් දහස් නවසිය අසූව දශකයේ රචනා වූ කාව්‍යයන්ට සමාජානුබද්ධ ප්‍රස්තුතයන් තේමා වීම වැළැක්විය නො හැකි විය. එහෙයින් සමකාලීන කවියෝ මිනිසා වෙත එල්ල වී ඇති අභියෝග විෂයෙහි සංවේදී වූහ. එමෙන් ම ඊට එරෙහි ව මානවයා සිදු කරන අරගලය කවිය වෙත කැඳවාගෙන  මීට පෙර යුගයන්හි දී කාව්‍ය නිර්මාණ හරහා බහුල වශයෙන් නිරූපණය කෙරුණු සෞන්දර්යාත්මක පක්ෂය පසෙකලා සමාජ වාණිජකරණය ත් සමඟ ම චලිත වන ගතානුගතික සමාජ සංස්කෘතික සත්තාවන් නිර්මාණ සඳහා තේමා කොට ගැනීම මෙම දශකයේ කවියේ කැපී පෙනෙන ලක්ෂණය විය.

එහි දී මෙම දශකය නියෝජනය කළ කවීන් අතුරෙන් රත්න ශ්‍රී විජේසිංහ, නන්දන වීරසිංහ, ආරියවංශ රණවීර සහ එරික්  ඉලයප්ආරච්චි යන කවීන් සිව් දෙනාගේ කාව්‍ය නිර්මාණ ඇසුරු කර ගනිමින් අදාළ තේමාව විමර්ශනය කර ඇත. බටහිර රටවල පවත්නා විවිධ සමාජ ප්‍රපංචයන්ගේ ආභාසය ලබමින් ලාංකේය සංස්කෘතිය පුළුල් විපර්යාසයන්ට බඳුන් වීම මෙම යුගයේ කවීන්ගේ කාව්‍ය නිර්මාණ තුළ වස්තු විෂය ක්ෂේත්‍රය අතින් පෝෂණය කරන්නට සමත් වී ඇත. ඒ අනුව මිනිසා ග්‍රාමීය කුටුම්භ ජීවිතයෙන් මිදී නාගරික දිවි පෙවතක් කරා සංක්‍රමණය වීම, පාරිසරික විනාශය, කාර්මීකරණය හේතුවෙන් බහුතර ධනපති පන්තිය විසින් සුළුතරයක් වූ නිර්ධන පාන්තික ශ්‍රමිකයන්ගේ ශ්‍රමය සූරා කෑම, මුදල් මත යැපෙන සමාජ ක්‍රමයක දුගී ජන ජීවිත ගත කරන ගැමියන් පත් වන අපහසුතාව, සමාජ නවීකරණය ත් සමඟ ම තරුණ පරම්පරාව සංකර ජීවන රටාවකට හුරු වීම, සාම්ප්‍රදායික කුටුම්භ ජීවිත විවිධ විපර්යාසයන්ට බඳුන් වීම, ගෝලීයකරණය යටතේ මෙ රටට පැමිණෙන විජාතික බලවේග හේතුවෙන් සිදු වන සමාජ සංස්කෘතිය විපර්යාසයන් මෙන් ම තරුණ පරම්පරාව සාම්ප්‍රදායික කෘෂි අර්ථ ක්‍රමයෙන් මිදී රැකියාවන් සොයා නගරයට සංක්‍රමණය වීම හේතුවෙන් සිදු වන නේවාසික ගැටලු ආදී තේමාවන් මෙම දශකයේ කාව්‍ය නිර්මාණ සඳහා පසුබිම් විය.

මෙ කී සියලු කාරණා සැළකිල්ලට ගැනීමේ දී මෙම දශකයේ මිනිසා මුහුණ දුන් දේශපාලන, ආර්ථික, සමාජීය මෙන් ම සංස්කෘතික අර්බුද හඳුනා ගැනීමට ත්, ඔවුනගේ ආශාවන්, අවශ්‍යතා හා අභිප්‍රායන් වටහා ගැනීමට ත් යථෝක්ත අවධියේ කාව්‍ය ව්‍යාපාරය අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වේ. තමන් අයත් හා තමන්ට බලපෑම් කළ හැකි සමාජ පන්තීන්ගේ මනෝ විඥානයේ මෙහෙයවීම යටතේ වුව ද සමාජ යථාර්ථය නිරූපණය කිරීමට අවශ්‍ය දෘෂ්ටිමය නිරවුල් භාවය මෙම දශකයේ කවියා සතු විය. මිනිසාට එරෙහි සැබෑ සමාජික විෂය හඳුනා ගැනීමට මෙම එක් දහස් නවසිය අසූව වර්ෂයෙන් ආරම්භ වූ දශකයේ නිර්මාණකරණයේ නිරත කවියා සමත් වීම මෙම අවධියේ කවියා ලැබූ වැදගත් ම දෘෂ්ටිමය ජයග්‍රහණය බව මෙම  අධ්‍යයනයෙන් විද්‍යමාන වේ

**පරිශීලිත ග්‍රන්ථ**

අමරකීර්ති, ලියනගේ (2016) **නව කවි සළකුණ**, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ

ඉලයප්ආරච්චි tßla (1988) **ආලින්දය**, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ

ඉලයප්ආරච්චි , එරික් (1981) **සිඳුහත්ගේ අගමෙහෙසිය**, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ

පල්ලියගුරු, චන්ද්‍රසිරි (1992) **සාහිත්‍යය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්**, කැලණිය, සම්භාව්‍ය ප්‍රකාශන

පෙරේරා, බී. ඒ. ටෙනිසන් (1993) **මානව හා සමාජ විද්‍යා ප්‍රවේශය**, බොරලැස්ගමුව, ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ,

රණවීර, ආරියවංශ (1984) **කවි කිහිපයක්**, කැලණිය, ශ්‍රීලා ප්‍රින්ටින් වර්ක්ස්

රණවීර, ආරියවංශ (1988) **ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ**, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,

විජේසිංහ, රත්න ශ්‍රී (1985) **වස්සානේ**, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

විජේසිංහ, රත්න ශ්‍රී (1988) **සුබ උදෑසන**, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

වීරසිංහ, නන්දන (1984) **ගිංගඟේ විලාපය**, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

Anderson, Edwin Robert (1967) **Encyclopedia of the Social sciences**, Macmillon publishers

Firth, Ramond (1956) **Human Types**, London, Thomas Nelson

Sirinivas, M.N.(1952) **Religion and Society Among the coorgs of south india**, Oxford university press

Tylor, Edward uenett (1926) **Primitive culture,** London, Jhon Murray, Alsemarle street